සැ. යු.- 2012.03.23 දින පළ වූ අංක 1,751 දරන ගැසට් පත්‍රයේ I-III කොටස පළ නොවීය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදයන් වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,752 - 2012 මාර්තු මස 30 වැනි සිකුරාදා - 2012.03.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 804 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මීත් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මීත් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 අප්‍රේල් මස 05 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 මාර්තු මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

803- B 80347— 7,100 (2012/03)
F1-(S/E)

# පළාත් සභා නිවේදන

**සම්මත අතුරු ව්‍යවස්ථා**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1691 හා 2011.01.28 දිනැති *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ නිවේදනය කරනු ලැබූ සබරගමුව පළාතේ මහ නගර සභා බල ප්‍රදේශ තුළ මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳව කෙටුම්පත්, අතුරු ව්‍යවස්ථා සබරගමුව පළාතේ, පළාත් සභාව විසින් 2011.07.26 දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේ දී පහත සංශෝධනවලට යටත්ව ස්ථිර කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. එස්. කීරගල,
ලේකම්,
සබරගමුව පළාතේ පළාත් සභාවේ පළාත් පාලන
අමාත්‍යාංශය.

2012 පෙබරවාරි මස 15 වැනි දින.

මහ නගර සභා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථාවේ සංශෝධන

1. 2011.01.28 දිනැති අංක 1,691 *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළවූ කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථාවේ 3(vii) ව්‍යවස්ථාවේ "ආහාර පිණිස හෝ අලංකාරය සඳහා" යන්නට පසුව "ඖෂධ" යන්න ඇතුළත් කිරීම.

2. 9 වැනි ව්‍යවස්ථාවේ "පරිශ්‍රය යන්නෙන් යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක්, පාවිච්චි කරනු ලැබූ හෝ අතහැර දමන ලිඳක්" යන්නට පසුව "පතල් වලක්" යන්න ඇතුළත් කිරීම.

03-1057/1

---

**සම්මත අතුරු ව්‍යවස්ථා**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1691 හා 2011.01.28 දිනැති *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ නිවේදනය කරනු ලැබූ සබරගමුව පළාතේ නගර සභා බල ප්‍රදේශ තුළ මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳව කෙටුම්පත්, අතුරු ව්‍යවස්ථා සබරගමුව පළාතේ, පළාත් සභාව විසින් 2011.07.26 දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේ දී පහත සංශෝධනවලට යටත්ව ස්ථිර කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. එස්. කීරගල,
ලේකම්,
සබරගමුව පළාතේ පළාත් සභාවේ
පළාත් පාලන අමාත්‍යාංශය.

2012 පෙබරවාරි මස 15 වැනි දින.

නගර සභා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථාවේ සංශෝධන

1. 2011.01.28 දිනැති අංක 1,691 *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළවූ කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථා පැනවීමේ නිවේදනයේ දෙවැනි ඡේදයේ "මහ නගර සභාව" යන්න ඉවත් කර "නගර සභාව" යන්න ඇතුළත් කිරීම.

2. 3(vii) ව්‍යවස්ථාවේ "ආහාර පිණිස හෝ අලංකාරය සඳහා" යන්නට පසුව "ඖෂධ" යන්න ඇතුළත් කිරීම.

3. 9 වැනි ව්‍යවස්ථාවේ "පරිශ්‍රය යන්නෙන් යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක්, පාවිච්චි කරනු ලැබූ හෝ අතහැර දමන ලිඳක්" යන්නට පසුව "පතල් වලක්" යන්න ඇතුළත් කිරීම.

03-1057/2

**සම්මත අතුරු ව්‍යවස්ථා**

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු, 261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ සබරගමුව පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඔහු විසින් සාදනු ලැබූ හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1,691 හා 2011.01.28 දිනැති *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ නිවේදනය කරනු ලැබූ සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ තුළ මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳව කෙටුම්පත්, අතුරු ව්‍යවස්ථා සබරගමුව පළාතේ, පළාත් සභාව විසින් 2011.07.26 දින පවත්වන ලද පළාත් සභා රැස්වීමේ දී පහත සංශෝධනවලට යටත්ව ස්ථිර කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. ඒ. එස්. කීරගල,
සබරගමු පළාතේ පළාත් සභාව,
පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්.

2012 පෙබරවාරි මස 15 වැනි දින.

ප්‍රාදේශීය සභා කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථාවේ සංශෝධන

1. 2011.01.28 දිනැති අංක 1,691 *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළවූ කෙටුම්පත් සම්මත අතුරු ව්‍යවස්ථාවේ 3(vii) ව්‍යවස්ථාවේ "ආහාර පිණිස හෝ අලංකාරය සඳහා" යන්නට පසුව "ඖෂධ" යන්න ඇතුළත් කිරීම.

2. 9 වැනි ව්‍යවස්ථාවේ "පරිශ්‍රය යන්නෙන් යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක්, පාවිච්චි කරනු ලැබූ හෝ අතහැර දමන ලිඳක්" යන්නට පසුව "පතල් වලක්" යන්න ඇතුළත් කිරීම.

03-1057/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.